Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - නර්තනය

සතිය-6 සතිය

ශ්‍රේණිය - 07

Prepared by- බළන්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලය

# වන්නම්වල සමාජ සංස්කෘතික පසුබිම

- උඩරට, පහතරට, සබරගමු යන නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්වයටම පොදු වූ වන්නම් මුල් යුගයේ රචනා වී ඇත්තේ ගායනය සඳහා ය.
- උඩරට හා සබරගමු වන්නම් විනෝදාස්වාදය සඳහා රචනා වී ඇති අතර පහතරට වන්නම් දෙවුන්දර උපුල්වන් (විෂ්ණු) දෙවියන් කෙරෙහි භක්තිය පෙරදැරි කොටගෙන ශාන්තියක් අපේක්ෂාවෙන් රචනා වී ඇත.
- ප්‍රස්තුතයෙන් කියවෙන අදහස ප්‍රකාශවීමත්, සම්ප්‍රදායික වන්නම් නර්තනයේ දී සිදු නොකරයි.

වන්නම් ව්‍යුහය

| උඩරට 18 | සබරගමු 24 | පහතරට (සින්දු වන්නම) 32 |
|---|---|---|
| බෙරපදය | බෙරපදය | බෙර පදය |
| තානම | තානම | තානම |
| කවිය | කවිය | කවිය |
| කස්තීරම | කලාසම | ඉරට්ටිය |
| සීරුමාරුව | අඩව්ව | |
| අඩව්ව | | |

- උඩරට තුරඟා වන්නම ඃ සිදුහත් කුමරු ගිහිගෙය අතහැර කන්තක නම් අසුපිට නැගී අනෝමා ගං තෙරෙන් එතෙර වී පැවදි බව ලබා ගත් අයුරු විස්තර වෙයි.

- **තලමල වරුණ කවිවල පසුබිම**

- **තල ගසේ ආයු කාලය අවසන් වන මොහොතේ තලමල පිපෙන බව ගැමි සමාජය තුළ පවතින විශ්වාසයකි.**
- **තලමලෙහි වර්ණය, ස්වභාවය, ප්‍රමාණය හේතු කොටගෙන තලමල වරුණ කවි ගැමියන් විසින් පබදින්නට හේතුවන්නට ඇත.**
- **නමුත් තලමල පිබිදීම එම ගමට අසුබ ලක්ෂණයක් යැයි ගම්මුන්ගේ මතයයි.**

**එනිසා එදා ගැමියන් තලමල කපා ගමෙන් ගෙනයාමේ දී එයට ගෞරව පිණිස හිසමත තබාගෙන රැගෙන ගිය බව කවිවලින් මතු කර දක්වයි.**



01 වන්නම් වල සමාජ සංස්කෘතික පසුබිම පිළිබඳ තොරතුරු ඇතුළත් කර කුඩා පොත් පිංචක් සකස් කරන්න. (උඩරට,පහතරට.සබරගමු)